සේරුවිල ප්‍රාදේශීය සභාව

----------------------------

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

--------------------------

1 මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 17 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් රු.7,653,261 ක ගොඩනැගිලි ඉදි කර ඇතත් එය රු 7,097,701 ක් ලෙස අවසන් ගිණුම්වලට ගැනීමෙන් ශේෂ පත්‍රයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.555,560 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.1,230,544 වුවත් එය අවසන් ගිණුම්වලට රු.1,097,508 ක් ලෙස ගැනීමෙන් ආදායම රු. 133,036 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු. 284,533 ක බැංකු ගිණුමේ ශේෂය අවසන් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයේ දෙසැම්බර් මස ගිවිසුම් අත්සන් කර ඇති ඉදිකිරීම් කොන්ත්‍රාත් 10 ක වැඩ ආරම්භ කර නොතිබිය දී ඇස්තමේන්තු වටිනාකම වන රු. 1,982,371 ක් වූ මුදල ශේෂ පත්‍රයේ ණයහිමියන් ලෙස දක්වා තිබුණි.

(ඉ) ණයහිමියන් වෙත රු.350,438 ක මුදලක් ගෙවා තිබූ නමුත් ප්‍රවර්තන වර්ෂය අවසානයේ එය ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 608,336 ක් වූ කොන්ත්‍රාත් තුනක රැඳවුම් මුදල් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

--------------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති.රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| | (i) 13 වැනි රීතිය | අදාළ වන වර්ෂය ආරම්භවීමට පෙරාතුව අයවැය ලේඛනයේ සහතික කරන ලද පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) 59 වැනි රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේ දී සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් ප්‍රාදේශීය සභාව විසින් සිදුකර නොතිබුණි. |
| | (iii) 143 වැනි රීතිය | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, පුස්තකාල තැන්පතු සහ අනෙකුත් තැන්පතු වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ගිණුම් ආරම්භ කර නොතිබුණි. |
| | (iv) 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.695,470 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 04 ක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,562,806 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,645,655 ක් විය.

2.2 මූල්‍ය පාලනය
------------------

සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි 2017 වර්ෂයේ සෑම මාසයක් අවසානයේදී ම රු. මිලියන 08 ත් රු. මිලියන 19 ත් අතර ප්‍රමාණයක ශේෂයක් පැවති අතර මෙම අතිරික්ත මුදල් ඵලදායි ලෙස ආයෝජනය කර ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය
------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | - | - | - | - | 10 | 2.5 | 2.5 | - |
| කුලී | 3,835 | 3,958 | 3,138 | 165 | 3,245 | 3,195 | 2,633 | 953 |
| බලපත්‍ර ගාස්තු | 565 | 1,605 | 816 | - | 656 | 720 | 720 | - |
| වෙනත් ආදායම් | 7,186 | 16,069 | 12,538 | 2,269 | 4,326 | 10,200 | 9,332 | - |

2.3 2 මුද්දර ගාස්තු
------------------

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගැනීමට සහ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 කුලී
-----

සභාවට අයත් කඩකාමර සහ තානායම සඳහා 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලැබිය යුතු කුලී ආදායම වන රු. 894,895 ක මුදල 2018 මැයි 17 දින වන විටද අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2017 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සභාව විසින් මාසිකව කසළ ටොන් 30 ක් පමණ බැහැර කරනු ලබන අතර, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව කසළ බැහැර කිරීම සිදු කර නොතිබුණි. එමෙන්ම එම ප්‍රදේශයේ ගැවසෙන වන සතුන් කසළ ආහාරයට ගැනීමට පුරුදු වී තිබීම නිසා මෙය වන සතුන්ගේ පැවැත්මට තර්ජනයක් වී තිබුණි. කෙසේ වුවද, වනජීවී දෙපාර්තමේන්තුව විසින් වෙන්කරන ලද භූමිය වටා විදුලි වැටක් සවිකර විධිමත්ව කසළ බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ප්‍රාදේශීය සභාව විසින් 2018 මැයි 17 දින වන විටද ගෙන නොතිබුණි.

(ඈ) පාරිසරික ගැටළු

---------------------

පරිසර බලපත්‍ර නිකුත් කිරීම

--------------------------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත, ගරාජ් සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ආයතන ආදී ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන එවැනි ව්‍යවසායන් 33 ක් එම බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්තය පවත්වා ගෙන යමින් තිබුණි. මේ සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස පරිසරය සුරැකීම කෙරෙහි අවධානය යොමු කර තිබූ අතර අදාළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙල හා ඒ සම්බන්ධ නිර්ණායක හඳුනා ගෙන නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

--------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුනි මස සිට පුරප්පාඩුව පවතින ආර්යුර්වේද වෛද්‍ය තනතුර සඳහා සුදුසු පුද්ගලයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරි හා ආදායම් පරීක්ෂක යන තනතුරුවල වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිහිටි ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සංඛ්‍යා ලේඛණ අනුව වසරකට රෝගීන් 1200කට පමණ ප්‍රතිකාර කර තිබුණත් මෙහි සේවය කල ආයුර්වේද වෛද්‍ය නිලධාරියා වෙනත් ස්ථානයකට මාරු වී යාමෙන් පසු වෛද්‍යවරයකු පත් කිරීමට සභාව විසින් කටයුතු නොකිරීම නිසා වෛද්‍ය මධ්‍යස්ථානය 2014 ජුනි මස සිට වසා තිබීමෙන් සහා බල ප්‍රදේශයේ ජනතාවට සේවය සපයා ඔවුන්ගේ සෞඛ්‍ය මට්ටම නංවාලීමේ අරමුණු ඉටු කිරීමට නොහැකි වී තිබුණි. තවද ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය වසා තිබීම හේතුවෙන් එහි ඇති රු. 45,078 ක් වටිනා බෙහෙත් ඖෂධ 22 ක් භාවිතයට ගත නොහැකි වී තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

------------------------------

3.4.1 පවරා නොගත් වත්කම්

--------------------------

වනජීවී දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම්වල සභාව විසින් 2017 දෙසැම්බර් 31 වන විට රු. 87,959,749 ක ක්‍රීඩාංගන, පොදු ළිං, ප්‍රජා ශාලා, ජල ටැංකි, සුසානාගාර හා පොදු වෙළදපලවල් ආදිය ඉදිකර තිබූ නමුත් මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි.

3.4.2 ඌණ උපයෝජිත වත්කම්

------------------------------

ප්‍රාදේශීය සභාව සතු රු. 675,000 ක් වටිනා ඩබල් කැබ් රථයේ ඉදිරිපස බාර් එක සහ ටයර් ධාවනයට නුසුදුසු වීම නිසාත් රු.100,000 ක් වටිනා මහේන්ද්‍රා කැබ් රථය වසර හතරක කාලයක සිට ඩීසල් පොම්පයෙහි ගැටළුවක් නිසාත් භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------------

නගර අලංකරණය සහ සභාවට ආදායමක් ලබා ගැනීමේ අරමුණින් ප්‍රාදේශීය සභාව විසින් දැන්වීම් ප්‍රචාරය සඳහා LED දැන්වීම් පුවරුවක් සවි කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 938,000 ක් 2014 මාර්තු 10 දින වියදම් කර තිබුණි. මෙම දැන්වීම් පුවරුව ක්‍රියාත්මක කිරීමේ දී යෙදිය යුතු ආලෝක ප්‍රමාණය හා ප්‍රචාරය කල හැකි දැන්වීම් ප්‍රමාණය පිළිබඳ සැළකිල්ලක් නොදක්වා කටයුතු කිරීමෙන් 2014 මාර්තු 17 දින සිට අක්‍රිය වී තිබිණි. මේ හේතුවෙන් මේ සඳහා වැය කල මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.6 ප්‍රසම්පාදනය
-----------------

3.6.1 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

විස්තර පහත පරිදි විය.

(අ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු. 27,709,341 (වැට් රහිත) ක වටිනාකමට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මෙම ගොඩනැගිල්ලේ පිරිවිතරයන්ට අනුකූලව ජනේල් සහ දොරවල් ඉදිකර නොතිබූ අතර ඒ වෙනුවෙන් රු. 1,842,680 ක් ගෙවා තිබූ අතර ජනේල්වල ග්‍රිල් යෙදීම වෙනුවෙන් ඇස්තමේන්තුවේ රු.630,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් එම කාර්යය ඉටු කර නොතිබුණි. එමෙන්ම 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 30,065,945 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ධ (CIGFL) වන රු. 75,165 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස්ට යැවීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව ගොඩනැගිල්ලේ වහලය නියමිත පරිදි සෙවිලි නොකිරීමෙන් ගොඩනැගිල්ල තුළට වැසි දිනයන්හිදී ජලය ගලා ඒම නිසා ගොඩනැගිල්ල තුළ කටයුතු කර ගෙන යාමට අපහසු වී තිබුණි. එමෙන්ම වැසිකිලි පද්ධතියේ ජලය කාන්දු වීම නිසා එය භාවිතයට ගත නොහැකි වී තිබුණි. ඉහත අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු නොකර රු.1,385,407 ක රඳවුම් මුදල් නිදහස් කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් ලිංගපුරම් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් නව පුස්තකාලයක් ඉදිකිරීම සඳහා පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.5,613,650 ක ගිවිසුම් වටිනාකමකට 2016 ජුලි 18 දින කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබූ අතර මෙම ගොඩනැගිල්ලෙහි ඇතුලත පොළවට සිමෙන්ති යොදා සකස් කර තිබුණද නිසි ප්‍රමිතියකින් තොරව සිදු කිරීම හේතුවෙන් එහි පොළවෙහි සිමෙන්තිය ස්ථාන කිහිපයක් පුපුරා ගොස් තිබුණි. එය පිළිසකර කිරීමට හා පුස්තකාලය සඳහා අවශ්‍ය විදුලිය හා ජලය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්තුවෙහි වැඩ නිම කොට 2016 නොවැම්බර් 14 දින වන විට සභාව වෙත භාරදිය යුතු වුවද, වැඩ නිම කිරීමේ සහතිකය ලබා දී තිබුණේ 2017 මාර්තු 15 දින වේ. ඒ අනුව ප්‍රමාද වූ මාස 04 සඳහා ප්‍රමාද ගාස්තු වන රු. 336,819 ක මුදල අඩුකර නොතිබුණි. එමෙන්ම පුස්තකාල කටයුතු ආරම්භ කිරිමට 2018 මැයි 15 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන - 2017 යටතේ සේරුනුවර බස්නැවතුම්පොළ ඉදිරිපිට කඩකාමර 02 ක් ඉදිකිරීම සඳහා වටිනාකම රු 1,563,767 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රජා සංවිධානයක් වෙත ප්‍රදානය කර තිබුණි. මෙහි ඇස්තමේන්තුවට අනුව ජනේල සකස් කිරීමේ දී ග්‍රිල් ආවරණ සහ විදුලි බල්බ සවිකිරීම සිදු කළ යුතු වුවද අදාල කර්යයන් 2017 මැයි 09 දින වන විටද නිමකර නොතිබූ අතර මෙහි පොළොවට යොදා ඇති සිමෙන්ති හා බිත්ති ස්ථාන කිහිපයකින් පුපුරා ගොස් තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඈ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන - 2017 ප්‍රතිපාදන යටතේ ලිංගපුර ප්‍රාදේශීය සභා උපකාර්යාලය අළුත්වැඩියා කිරීම සඳහා වටිනාකම රු.1,439,931 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රජා සංවිධානයක් වෙත ප්‍රදානය කර තිබූ අතර ප්‍රජා සංවිධානය විසින් වටිනාකම රු.54,100 ක් වූ කාර්යයන් වන ජල සැපයුම ලබා ගැනීම හා වැඩවිෂය අංක 09 යටතේ ජනේලයක් සවිකිරීම හා ධාරිතාවය ලීටර 1000 ජලටැංකියක් සවිකිරීම සිදු කර නොතිබුණි. කෙසේ වුවද සභාව විසින් එම කාර්යයන් ඉටු කර ඇති බවට සහතික කරමින් ගෙවීම සඳහා බිල්පත්‍ර පළාත් පාලන කොමසාරිස්වරයා වෙත යවා තිබුණි. එමෙන්ම

උපකාර්යාලයේ අළුත්වැඩියා කටයුතු 2017 දෙසැම්බර් 26 දින නිම කර තිබුණද කාර්යාල කටයුතු 2018 මැයි 15 දින වන විටද ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන 2017 ප්‍රතිපාදන යටතේ රු.1,489,383 ක මුදලක් වැයකර සේරුවිල පූජා භූමි රථගාලේ පොදු වැසිකිලියක් ඉදි කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2017 දෙසැම්බර් 04 දින නිමකර තිබූ අතර සභාව විසින් එය ටෙන්ඩර් කිරීමට හෝ සභාවේ කම්කරුවෙකු යොදවා නඩත්තු කර ආදායම් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් 2018 මැයි 15 දින වන විටද නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) 2013 ජූලි 26 දිනැති අංක FC/3/3/2013 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව අනුමත ප්‍රජාපාදක සංවිධාන සඳහා ලබා දිය හැකි උපරිම කොන්ත්‍රාත්වල වටිනාකම රු.2,000,000 වේ. කෙසේ වුවද සභාව විසින් ප්‍රජා සංවිධාන 03 ක් සඳහා එම වටිනාකම ඉක්මවා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

(උ) සභා අරමුදල් යටතේ ඉදිකිරීම් කිරීම සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.1,982,371 ක කොන්ත්‍රාත් ගිවිසුම් 10 ක් 2014 වර්ෂයේ දෙසැම්බර් මස අත්සන් කර ඇතත්, අදාළ කොන්ත්‍රාත්වල වැඩ 2018 මැයි 15 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

4. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | -------- | | ----------- |
| (අ) | ගිණුම්කරණය | :- | ගිණුම් තැබීම, උපයෝගී ලෙජර පවත්වාගෙන යාම |
| (ආ) | ආදායම් අයකිරීම | :- | හිඟ ආදායම් අයකිරීම, ආදායම් ලේඛන පවත්වාගෙන යාම |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | :- | වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | :- | කොන්ත්‍රාත් බදු මුදල් ගෙවීම , ගිවිසුමට අනුව කාර්යයන් ඉටුකරවා ගැනීම |
| (ඉ) | මානව සම්පත් කලමනාකරණය | :- | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම |